# පටිච්චසමුප්පාදය (දහතුන්වෙනි කොටස)
## 29.09.2019 - ශ්‍රී ලංකාරාමය
## නුවරඑළිය

හොඳයි, අද මම මේ පින්වතුන්ට කියලා දෙනවා පටිච්චසමුප්පාද අංගයන්ගේ තිබෙන්නා වූ එක්තරා විදියක ධර්ම ස්වභාවයක්. පටිච්චසමුප්පාද අංග 12 තිබෙනවා. ඒ තමයි අවිද්‍යාව - සඞ්ඛාරය - විඤ්ඤාණය - නාමරූප - සළායතන - ඵස්ස - වේදනා - තණ්හාව - උපාදාන - භව - ජාති - ජරා මරණ. මේකට කොතැනින් සම්බන්ධ වෙලා බැලුවත් ඒක පටිච්චසමුප්පාදය බැලීමක් තමයි.

'ජාතිය ඇති උනේ භවය නිසා' කියලා බලන කොටම ඒක පටිච්චසමුප්පාදය බැලීමක් වෙනවා. 'උපාදානය ඇති උනේ තණ්හාව නිසා' කියලා බලන කොටත් ඒක පටිච්චසමුප්පාද අංග බැලීමක්. නැත්නම් 'නාම රූප හැදුනේ විඤ්ඤාණය නිසා' කියලා බැලුවත් ඒක පටිච්චසමුප්පාදය බැලීමක්. මේ අංග 12 හම බැලුවත් පටිච්චසමුප්පාදයයි. ඒවගේම අංග 6 ක් බැලුවත් පටිච්චසමුප්පාදයයි. අංග 4 බැගින් බැලුවත් පටිච්චසමුප්පාදයයි. එක් පටිච්චසමුප්පාද අංගයක් අනෙකට හේතු වෙන ස්වභාවය බැලුවත් ඒකත් පටිච්චසමුප්පාදයයි, හේතු ඵල බැලීමයි. නමුත් මේක සර්ව සංග්‍රහයික දේශනාවක් නිසා අංග 12 හම තිබෙනවා. නමුත් ඒකෙන් කියන්නේ නෑ, ඔක්කෝම එකට බලන්න ඕනෑ කියලා, එක එක්කෙනාගේ ඥානය නුවණ බුද්ධිය ප්‍රඥාව තිබෙන විදියට තමයි ඒ ඒ තැන් හසුවෙන්නේ.

මේ අංග වල තිබෙනවා එක්තරා විදියක ස්වභාව ධර්ම හතරක්. **සංස්කාර** හටගැනීම සිද්ධ වෙන්නේ **අවිද්‍යාව** ළං උනොත් පමණයි. සංස්කාර කියන්නේ ආයූහන ගතියක්, එකතු කරන ගතියක්. මේක අපිට හිතේ තියාගන්න ලේසියි, නමුත් ඒක අමුතුම විදියේ රහස් ධර්මයක්. මේ සංස්කාරය කියලා කියන එකේ නොදැනුවත්ම පුදුම විදියට එක්කාසු කරන ගතියක්, රකින ගතියක්, එකතු කරගන්න ගතියක් තිබෙනවා. ඒකට කියනවා **ආයූහන ලක්ෂණය** කියලා. එකතු කරපු දේ පේන්නත් නෑ, නොකර ඉඳලත් නෑ. නමුත් ඒ එක්කාසු කිරීම, ඒ රැස් වීම, ආයූහන ගතිය සිද්ධ වෙන්නේම **අවිද්‍යාව** ඒකට ළං වෙලා හේත්තු උනොත් විතරයි. උදාහරණයක් ගත්තොත් අපි යම්කිසි අරමුණක් දෙස බැලුවහම ඒ අරමුණ පිළිබඳව නොවැටහීම, නොදැනීම, මුලාව උනොත් විතරමයි ආයූහන කියන ක්‍රියාව සිද්ධ කරන්නේ, ඒ අරමුණ සම්බන්ධයෙන්. එහෙම නැති උනොත් අරමුණ සම්බන්ධයෙන් මොකක්වත් එකතු කරන්නේ නෑ.

ඊළඟට **විඤ්ඤාණය** ගත්තොත් ඒ විඤ්ඤාණය ප්‍රතිසන්ධියක් ඇති කරනවා, විපාකයක් දෙනවා. ඒ ප්‍රතිසන්ධිය ඇති කරන විපාක විඤ්ඤාණය හැදෙන්නෙම ඒකාන්තයෙන්ම රැස් කිරීමක් වෙලා තිබුණොත් විතරමයි. රැස් වීමක් නොවූ කළ කවදාකවත් විපාක හැදීමක් වෙන්නේ නෑ. මෙහෙම බලාගෙන ගියාට පස්සේ අවිද්‍යාව හරියට link වෙනවා සංස්කාරයට, එකතු කරන ගතියට. එකතු කරන ගතිය ඒකාන්තයෙන්ම link වෙනවා විපාක දීමට. ඒ කියන්නේ ගත්තනම් දෙයක් දෙන්න ඕනෑ. විපාකය කියලා කියන්නේ දෙන දේ. විපාකය කියලා කියන්නේ අත්හරින දේ. විපාකය කියලා කියන්නේ ගොඩගහ ගත්තු දේ අතහැරීම. එතකොට යම්කිසි දෙයක් අත්හැරෙන්න release වෙන්න නම් ඉස්සෙල්ලා එකතු කරගත්ත දෙයක් තිබෙන්න ඕනෑ. එකතු කිරීමක් නැතුව පිට කිරීමක් වෙන්නේ නෑ. මෙන්න මේ ධර්මතා දෙක එකක් නොවෙයි. 'විපාකය' කියන එක 'රැස් කිරීමට' වෙනස්. යමක් විපාක දෙන්නේ විපාක දීමට ශක්තියක් තිබුණොත් විතරයි. විපාක දෙන්න ශක්තියක් උපදවන්නේ ආරම්මණය නොදැනීම නිසයි. මේ විදියට අවිද්‍යාවයි - සංඛාරයයි - විඤ්ඤාණයයි එකින් එකට වෙනස් වෙනස් ස්වභාවයන් තිබෙන්නා වූ දේවල්. නමුත් මේවා එක line එකක තිබෙන දේවල්. මේවා එක පරමපරාවක, එක පේළියක තමයි වැඩ කරන්නේ.

ධර්ම ගොඩක් තිබෙනවා. උදාහරණයක් හැටියට ගත්තොත් එහෙම ගහක හෙවනැල්ලක් හැදෙනවා. ගහක තිබෙනවා අංග ගොඩක්. ගහේ මුල් තිබෙනවා, කොළ තිබෙනවා, මහා කඳක් තිබෙනවා, පොතු තිබෙනවා, අරටුව තිබෙනවා. නමුත් මේ හැම එකකින්ම හෙවනක් හදලා දෙන්නේ නෑ. මුල ගහේ අංගයක් උනාට ඒක හෙවනක් හදලා දෙන්නේ නෑ. හෙවනක් හදලා දෙන්නේ ගහේ උඩ තිබෙන්නා වූ කොළ දළු වලින්. මුල කඳ අරටුව තිබුණා කියලා ඒවා සෙවන දෙන්න ඍජුව සම්බන්ධ වෙන්නේ නෑ, නමුත් සම්බන්ධ නෑ කියලා කියන්නත් බෑ. මුල තිබෙන්නේ පොළව යට. මෙන්න මේ වගේ ගොඩක් ධර්ම තිබුණාට සංස්කාර උපදවන්න හේතු වෙන්නේ නෑ ඔක්කොම.

සංස්කාර උප්පත්තියට හේතු වෙන්නේ එකම එක ධර්මයයි. ඒ තමයි ආරම්මණයේ තිබෙන යථා ස්වභාවය වසා දමන **අවිද්‍යාව**. අරමුණ යම්කිසි ප්‍රමාණයකට cover කරාද, ඒක හැංගුවාද, ඒක වහලා දැම්මාද, ඒක හරියට පේන්නේ නැත්ද එතකොට තමයි රැස් කිරීම වෙන්නේ. ඒක නිසා තමයි **විපාක** දෙන්නේ. ඒ විපාක විඤ්ඤාණය නිසා තමයි **නාම රූප** හැදෙන්නේ. නාම රූප නිසා තමයි **සළායතන** හැදෙන්නේ. මේවා දිහා බලාගෙන ගියහම මේ ධර්ම එකට එකක් හේතුවෙන ස්වභාවයෙන් පේළියට තිබෙනවා. මෙන්න මේ විදියට බැලුවහම අවිද්‍යාව නොවෙයි සංස්කාරය. සංස්කාරය නොවෙයි විඤ්ඤාණය. මේ ධර්මතා වලට වෙන වෙන ලක්ෂණ වෙන වෙන ගුණ ස්වභාව තිබුණත් මේවා එක පේළියකට තමයි තිබෙන්නේ. මෙන්න මේ ක්‍රමයට කියනවා **ඒකත්ත නය** ස්වභාවය කියලා. ඒ කියන්නේ එකම පරම්පරාවක තිබෙන්නේ නමුත් වෙනස් වෙනස් ධර්ම.

තවත් විදියකින් බැලුවොත් අපි මේ විදියට කියනවා. තාත්තා - පුතා - පුතාගේ පුතා (මුණුබුරා) කියලා පරම්පරාවක් තිබෙනවා. මේ පරම්පරාව ගත්තහම ඔක්කොම එක්කෙනෙක් නොවෙයි. තාත්තාගෙන් තමයි පුතා, පුතාගෙන් තමයි මුණුබුරා. තාත්තා ආවේ සීයාගෙන්. මේ සියලු දෙනා එක පුද්ගලයෙක් නොවෙයි. මේ සියලුදෙනා එක පුද්ගලයෙක් නොවුනාට මේ අයගේ පරම්පරාව එකයි, එක්කෙනෙකුට එක්කෙනෙක් හේතු වෙනවා. අන්න ඒ වගේ තමයි මේ **ඒකත්ත නය** ස්වභාවය. ධර්ම ඔක්කෝම වෙනස්, ධර්ම වල ඔක්කොම හැඩ තල වෙනස්, ලක්ෂණ වෙනස්. නමුත් මේ ධර්ම එක පේළියකට තමයි ක්‍රියාත්මක වෙන්නේ.

බලන්න, ගහ කියන එකේ කොළ වෙනස්, අතු වෙනස්, රිකිලි වෙනස්, කඳ වෙනස්, ගෙඩි වෙනස්, මල් වෙනස්. ඒවගේම ගහෙන් ගන්න පොතු කැල්ලක සුවඳයි, මුලෙන් ගන්න පොතු කැල්ලක සුවඳයි, අත්තකින් ගන්න පොතු කැල්ලක සුවඳයි, ඒ ගහේ කොළයක් පොඩි කරහම තිබෙන සුවඳයි, ගෙඩියක් පොඩි කරහම තිබෙන සුවඳයි, මලේ තිබෙන සුවඳයි එකම වෙන්නේ නෑ. එකම ගහේ උනාට මේ සුවඳ එකම වෙන්නේ නෑ. මේවායේ තිබෙනවා වෙනස් වෙනස් ගති. නමුත් මේවා සියල්ලම මේ ගහේ පරම්පරා ලක්ෂණ. මෙන්න මේ වගේ අවිද්‍යාව වෙනයි, සංඛාරය වෙනයි, විඤ්ඤාණය වෙනයි, නාම රූප - සළායතන කියන්නේ වෙන වෙන ඒවා, ඵස්ස - වේදනා වෙනයි, තණ්හා - උපාදාන වෙනයි, භව - ජාති - ජරා මරණ කියන ධර්ම සියල්ල එකිනෙකට වෙනස්. මේ ධර්ම වෙනස් උනාට හැම වෙලේම එක පේළියකට තිබෙන්නේ. මෙන්න මේ ස්වභාවය දැන ගන්නවාට කියනවා **ඒකත්ත නය** කියලා. එක පේළියකට තිබෙන පරම්පරානුගත නය විභාගය. පටිච්චසමුප්පාදය ගැඹුරින් තේරුම් ගන්න නම් මේක මේ විදියටම තේරුම් ගන්න ඕනෑ.

තවත් එකක් මෙහෙමත් හිතලා බලන්න, භූමිතෙලුයි වතුරයි එකට දැම්මොත් එකතු වෙන්නේ නෑ, ඒවගේම භූමිතෙලුයි පොල්තෙලුයි දැම්මත් එකතු වෙන්නේ නෑ, පොල්තෙලුයි වතුරයි දැම්මත් එකට එකතු වෙන්නේ නෑ. දැන් අපි ඔය වගේ පොල් තෙල් ටිකකුයි භූමිතෙල් ටිකකුයි වතුර ටිකකුයි එක කෝප්පෙකට දැම්මත් මේවා වෙනස් වෙනස් අංග. අන්න ඒවගේ එක පේළියකට තිබුණාට මේවා වෙනස් අංග. මෙන්න මේ ගතිය විශේෂයෙන්ම තේරුම් ගන්න ඕනෑ. එතකොට තමයි මේවා එක ඇඳියකට තිබුණත් අර්ථ වෙනස් වෙනස් විදියට කඩලා වෙන් කරලා තනි කරලා තේරුම් ගත්තොත්

තමයි ආත්ම සංඥාව අයින් කරන්න පුළුවන් කම තිබෙන්නේ. අපිට මේ ලෝකයේ තිබෙන දේවල් වැටහෙන්නේ වෙන වෙනම නොවෙයි. අපිට ලෝකයේ තිබෙන දේවල් වැටහෙන්නේ එක පොදියටයි, එක රංචුවකටයි, එක පරාසයකටයි. එක පරාසයකට එක රංචුවකට එක පොදියකට ඉදිරිපත් වෙලා ඒක අපිට මතු කරලා දෙන්නේ වෙනම පින්තූරයක්. වෙනම ස්වභාවයක්, වෙනමම ධර්ම ගතියක් තමයි මතු කරලා දෙන්නේ. ඒ මතු කරලා දෙන බොරුවට තමයි අපි අහුවෙන්නේ. පටිච්චසමුප්පාදය තේරුම් ගන්න කොට මේවා වෙන වෙනම දේවල් කියලා අපි අහුවෙලා තිබෙන මුලා වීමෙන් අපේ හිත මිදෙනවා. ඒක නිසා මේකට කියනවා **ඒකත්ත නය** ස්වභාවය කියලා.

සංස්කාර නිසා හට ගන්නා වූ විඤ්ඤාණයට සංස්කාරයන්ට වඩා ඉතාම වෙනස් ලක්ෂණයක් තිබෙන්නේ. එහෙම උනත් එකම පරම්පරාවකට හිමිකම් කියන නිසා තමයි ඒකට ඒකත්ත නය කියලා කියන්නේ. අපිට මේ ලෝකයේ තිබෙන දේවල් වෙන වෙනම තේරෙන්නේ වැටහෙන්නේ නැත්තේ ඒවා එක පේළියකට, එක සන්තතියකට, එක රංචුවකට තිබෙන නිසයි. ඒවා විස්තර කරන කොට සමූහ ප්‍රඥප්ති තිබෙනවා, සන්තති ප්‍රඥප්ති තිබෙනවා, ඝන ස්වභාවයක් තිබෙනවා. ලොකු කන්දක් කියලා කිව්වහම අපි ගන්නේ එක පොදියකට. ඒවගේම දිග අත්තක් කියලා ගත්තහම අපි ගන්නේ එක රංචුවකට. මේ සන්තතියෙන්, පේළියෙන්, රංචුවෙන් අපේ හිත වැහිලා තිබෙන්නේ. එතකොට මේ අවිද්‍යාව සංස්කාරය විඤ්ඤාණය යන මේ කියන්නා වූ ධර්ම එකම එක පරම්පරාවක කියාත්මක වෙවී තිබුණත් ඒවා ලක්ෂණ වශයෙනුත් වෙනස් - හේතු ධර්ම හැටියට ගත්තත් ඵල ධර්ම හැටියට ගත්තත් වෙනස් - කාල වශයෙන් ගත්තත් වෙනස්.

මේක තේරුම් ගන්නේ මෙහෙමයි. දැන් අපි ඉපදිලා ඉන්නවා. දැන් අපිට විපාක විඤ්ඤාණ තිබෙනවා. අපිට ඇසක් කනක් නාසයක් තිබෙනවා. දැන් මේ වර්තමානයේ තිබෙන්නා වූ රූප ස්වභාවය ඇතිවෙන්න පළමුවෙන්ම ප්‍රතිසන්ධි විඤ්ඤාණයක් ඇති උනා. ඒ ප්‍රතිසන්ධි විඤ්ඤාණය නොවෙයි දැන් තිබෙන්නේ. නමුත් ප්‍රතිසන්ධි විඤ්ඤාණයක් නැතුවත් මේ රූප ස්වභාවය ඇතිවෙන්නේ නෑ. ඒ කියන්නේ කාල වශයෙන් වෙනස්. දැන් ප්‍රතිසන්ධි විඤ්ඤාණය පහළ වෙලා ගොඩක් කල්. ඒ විඤ්ඤාණය පහළ උනාට පස්සේ තමයි මේ රූප ස්වභාවය තිබෙන්නේ. ප්‍රතිසන්ධි විඤ්ඤාණය පහළ වෙන්න සංස්කාර හැදූවා. ඒ සංස්කාර හැදූවේ ඊටත් කලින්. ඒකත් කාල වශයෙන් වෙනස්. සංස්කාර හැදූවේ වෙන කොහේ හරි. ඒකෙ ප්‍රතිසන්ධි විඤ්ඤාණය තිබුණේ තවත් තැනක. ඊට පස්සේ නාම රූප තවත් තැනක. මේවා කාල වශයෙන් වෙනස්. එකම පරම්පරාවේ උනාට තැන් වශයෙන් කාල වශයෙන් වෙනස්. මෙසේ කාල වශයෙන් වෙනස් වෙන එකත් බලන්න ඕනෑ සහ ලක්ෂණ වශයෙනුත් වෙනස් කම් බලන්න ඕනෑ. දැන් තිබෙන මේ සිතේ සහ කයේ ලක්ෂණ නොවෙයි ප්‍රතිසන්ධි විඤ්ඤාණයට තිබුණේ. ප්‍රතිසන්ධි විඤ්ඤාණයේ හැඩ රුව නොවෙයි සංස්කාරයන්ගේ තිබෙන්නේ. ඒවායේ තිබෙන්නේ වෙන වෙන ලක්ෂණ. සංස්කාරයන්ගේ ලක්ෂණ නොවෙයි අවිද්‍යාවේ තිබෙන්නේ. ලක්ෂණයන්ගෙනුත් මේවා වෙනස්. එක පරම්පරාවේ එක පේළියේ උනාට ඒවා කාල වශයෙනුත් වෙනස්, ලක්ෂණ වශයෙනුත් වෙනස්, ඊළඟට හේතුවෙන හැටියටත් වෙනස්. එකම පේළියේ තිබුණාට සංස්කාරයෝ නොවෙයි නාම රූපයන්ට ළඟින්ම හේතු උනේ, නාම රූපයන්ට ළඟින්ම හේතු උනේ විඤ්ඤාණයයි. විඤ්ඤාණයට ළඟින්ම හේතු උනේ සංස්කාරයි, අවිද්‍යාව නොවෙයි. මේ වගේ එකම පරම්පරවේ තිබුණාට හේතු වීම වශයෙන් වෙනස්, ලක්ෂණ වශයෙන් වෙනස්, කාල වශයෙන් වෙනස්. මේවගේ එක පේළියක තිබෙන දේවල් වෙන වෙනම තේරුම් ගැනීමට කියනවා **නානත්ත** ස්වභාවය තේරුම් ගන්නවා කියලා. ඒකට **නානත්ත නය** කියලා කියනවා.

**ඒකත්ත නය** = වෙන වෙන ධර්ම ඔක්කොම එකම පේළියක තිබීම.
**නානත්ත නය** = මේ ධර්ම එක පේළියක තිබුණාට ඒවා වෙන වෙන ලක්ෂණ වලින් යුක්තයි.

තේ එකක් ගත්තම තේ ඒකෙ තිබෙනවා හැදෙන ක්‍රියාවලියක් සහ තේ එක පෙවෙන ක්‍රියා වලියක්. එකට මිශ්‍රවෙන ක්‍රියා වලියකුත් තිබෙනවා. අපේ වර්තමානය ගත්තම ආන්න ඒවගේ. තේ එකක් බොන වෙලාව තේ එකක් හැදෙන වෙලාව නොවෙයි. තේ එකක් බොනවා කියලා කියන්නේ කෝප්පයේ තිබෙන ටික ශරීරගත වෙලා අඩුවෙනවා. නමුත් තේ එක හදන වෙලාව, බොන වෙලාව නොවෙයි. බොන වෙලාවේදී තේ ටික කෝප්පෙන් එළියට යනවා. තේ එක හදන වෙලාවට කෝප්පය ඇතුලට යනවා. ඒවගේම තේ කෝප්පෙට එන ඒවා ඔක්කොම එන්නෙත් වෙන වෙනම. ඒ තමයි වතුර, තේ කොළ, සීනි තව මොනවා හරි දානවා නම් ඒවත් ඔක්කොම එන්නේ වෙන වෙනම. මේ ද්‍රව්‍ය වල තිබෙන ගතිත් එකිනෙකට වෙනස්. සීනි වල තිබෙන ගතිය නොවෙයි වතුර වල තිබෙන්නේ. සීනි වල තිබෙන ගතිය නොවෙයි තේ කොළ වල තිබෙන්නේ. මේ වගේ වෙනස් වෙනස් ලක්ෂණ තමයි මේවායේ තිබෙන්නේ. ආන්න ඒ වගේ වෙන වෙන ලක්ෂණ බැලීමට, කාල වකවානු බැලීමට විග්‍රහාත්මකව අපේ හිත දක්ෂ වෙන්න ඕනෑ. එහෙම දක්ෂ වෙනකොට තමයි මේ ධර්ම කඩන්න බිඳින්න පුළුවන් කම තිබෙන්නේ. එතකොට තමයි මේ ධර්ම තනි කරලා ගන්න පුළුවන් කම තිබෙන්නේ. මේ ධර්ම තනි කරලා ගත්තම තමයි ලක්ෂණ පේන්නේ. එතකොට තමයි ධර්ම හොඳට බිඳ බලා ගන්න පුළුවන් කම තිබෙන්නේ. එතකොට තමයි ධර්මය අවබෝධ වෙන්නේ, නිවන් අවබෝධ කරගන්න පහසු වෙන්නේ. ඒක නිසා තමයි මේ බෙදීමේ ක්‍රමය, කාණ්ඩ කිරීමේ ක්‍රමය, වෙන් කිරීමේ ක්‍රමය බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ.

තව එකක් තිබෙනවා. ඒ තමයි වතුර තිබෙනවා, තේ කොළ තිබෙනවා, කෝප්පයක් තිබෙනවා නමුත් මේ වතුර දන්නේ නෑ 'ගින්දර දාල මම මේ පැහෙන්නේ තේ හදන්න' කියලා. වතුර වල කිසිම උත්සාහයක් නෑ තේ හදන්න. තේ කොළ වල කිසිම උත්සාහයක් හැඟීමක් ඕනෑකමක් නෑ 'මම අර උණුවතුරත් එක්ක කවලම් වෙලා දිය වෙලා යනවා' කියලා. සීනි වලත් කිසිම උත්සාහයක් උද්යෝගායක් නෑ 'මම තේ එකත් එක්ක දිය වෙලා යනවා' කියලා. මේ විදියට තේ කොළ වලයි වතුර වලයි සීනි වලයි ඉඟුරු වලයි තිබෙන්නේ වෙන වෙන ලක්ෂණ.

ඊළඟට තවත් බලන්න, තේ කොළ කෝප්පෙට වැටෙන වෙලාවට නොවෙයි වතුර කෝප්පෙට වැටෙන්නේ. ඉස්සෙල්ලා කෝප්පෙට වැටෙන්නේ තේ කොළ. තේ කොළ ටික කෝප්පෙට වැටුනෙත් තනියම. ඊළඟට තමයි උණු වතුර වැටෙන්නේ. ඊට පස්සේ හරි ඉස්සෙල්ලා හරි තමයි සීනි වැටෙන්නේ. එතකොට මේ කෝප්පෙට තේ කොළ වැටෙන වෙලාව කාලය වශයෙන් වෙනස්. වතුර වැටෙන වෙලාවත් කාලය වශයෙන් වෙනස්. සීනි වැටෙන වෙලාව, ඉඟුරු වැටෙන වෙලාව කාලය වශයෙන් වෙනස්. ඊළඟට බොන වෙලාවට 'තේ කොළ ටික පෙව්ලා - ඊට පස්සේ වතුර ටික පෙව්ලා - ඊට පස්සේ ඉඟුරු ටික එක්කාසු වෙලා - ඊට පස්සේ සීනි බොනවා' කියලා එහෙම එකකුත් නෑ. එතකොට අපිට පේනවා මේකේ තිබෙන විවිධත්වය. ලක්ෂණ වශයෙන් වෙනස් වූ පාට වශයෙන් වෙනස් වූ හැඩ ස්වභාවයෙන් වෙනස් වූ ධර්ම ටිකක් පමණක් තිබෙනවා. වතුර දියාරු ගතියෙන් යුක්තයි. තේ කොළ කළු වර්ණයෙන් යුක්තයි සහ ඝන ස්වභාවයක්, කැබලි ස්වභාවයක් තිබෙනවා. ඊට වඩා හැඩෙනුත් වෙනස් සීනි. මේක පොඩි උදාහරණයක් පමණයි. මේ තේ එක ගැන කියලා දුන්නේ පටිච්චසමුප්පාදය තේරුම් කරලා දෙන්න. පටිච්චසමුප්පාදය ඒ තරමම ගාම්භීරයි. පටිච්චසමුප්පාදය දිහා බැලුවහම තේරෙනවා වෙන වෙන හැඩ තල, වෙන වෙන ලක්ෂණ, කාල, හේතු වෙන විදිය ආදී බොහෝ දේ.

තවත් එකක් තිබෙනවා. තේ එකේ තිබෙන්නා වූ පාට හැදෙන්නේ සීනි නිසා නොවෙයි. ඒකට වතුරේ විශේෂ පාටකුත් නෑ. ඒ පාට හැදෙන්නේ තේ කොළ නිසා. නමුත් තේ කොළ වලට කිසිම හැඟීමක් උද්යෝගයක් නෑ 'මම ගිය ගමන්ම මේ වතුර ටික පාට කරනවා' කියලා. සීනි වලටත් හැඟීමක් නෑ 'මම ගිය ගමන්ම මේ ඔක්කොම රස කරනවා' කියලා. මෙන්න මේ වගේ අනුත්සාහික ගතියක් තිබෙනවා මේ හැම ධර්මයකටම. අනිත් අයට උදව් වෙනවා කියලා කිසිම උත්සාහයක් ඕනෑකමක්

හැඟීමක් මේ ධර්ම වලට නෑ. මේවා හුදකලා තනි ධර්ම. අන්න ඒවගේ **අවිද්‍යාව** දන්නේ නෑ 'මම සංස්කාර හදන්න යනවා' කියලා. සංස්කාරයෝ ඉබේ හැදෙනවා, අවිද්‍යාව ආවහම. සංස්කාරයන්ගේ විශේෂිත උත්සාහයක් නෑ **විඤ්ඤාණ** හදනවා කියලා. ඒකට කියනවා **අනුත්සාහික ගතිය** කියලා. මේ ධර්ම අනිත් ඒවාට හේතු වෙනවා නමුත් ඒවා අනුත්සාහිකයි. මේ ස්වභාවයට කියනවා **අව්‍යාපාර නය ස්වභාවය** කියලා. තනි තනි ධර්ම තිබෙනවා, ඒවා ඒ විදියටම පවතිනවා.

දැන් බලන්න මේසයක් ගත්තහම ඒ මේසයේ කකුල් තිබෙනවා, තට්ටුවක් තිබෙනවා. මේවා දිහා බැලුවහම අපිට මේසය පේනවා. ඔය මේසය කියන එක ඔය විදියට ගත්තහම කකුල් හතර දන්නේ නෑ අපි ලෑල්ලක් උස්සගෙනයි ඉන්නේ කියලා. ඒවගේම තමයි එක කකුලක්වත් දන්නෙ නෑ තවත් කකුල් තුනක් එහා පැත්තේ තිබෙනවා කියලා. එවගේම ලෑල්ල දන්නෙත් නෑ 'මම මේ කකුල් හතරක් උඩ තමයි ඉන්නේ' කියලා. මේ සවභාවයට කියනවා **අව්‍යාපාර ධර්ම ස්වභාව** කියලා. අනුත්සාහිකව, අනිත් එකකට හේතු වීමට උත්සාහයක් ඕනෑකමක් නැතුව තිබෙනවා. නමුත් ඒවා හේතුත් වෙනවා. මේ ධර්ම තනි කරලා බලන්නේ මෙන්න මේ විදියටයි. මේ විදිය ස්වභාවයක් තමයි සෑම ධර්මයකම තිබෙන්නේ.

දැන් අපි මේ ඉන්න ශ්‍රී ලංකාරාමය හරියේ තිබෙන අහස තිබෙනවා. මේ අහස අපි නවසීලන්තයට එන්න ඉස්සෙල්ලත් තිබුණා. අපි නවසීලන්තයට ඇවිල්ලා වෙන වෙන තැන් වල ඉන්න කොටත් අහස මෙතැන තිබුණා. එතකොට මේ අහස කොටස පස්සේ කාලයේදී මේ සියලු දෙනාම එකතු වෙලා මුදල් දාලා ලී දඬු අරගෙන ගොඩනැගිල්ලක් හැදුවා. එතකොට අහස දන්නේ නෑ, 'මේ කට්ටිය එකතු වෙලා මගේ අස්සේ තමයි මේ කණු ටික හිටෙව්වේ' කියලා. මේ අහස කියන ධර්මය වෙනමම හුදකලා වෙච්ච ධර්මයක්. ඒවගේම ලී කණු දන්නේ නෑ 'අපි ගිහිල්ලා අහස අස්සේ තමයි හිටවිලා තිබෙන්නේ' කියලා. ලී දඬු කියන්නේ වෙනම ලක්ෂණයක් තිබෙන ද්‍රව්‍යක්. මේවා අනුත්සාහිකයි. ඒවගේම මේ වහළ දන්නේ නෑ 'අපි මේ අහස ආධාර කරගෙන කණු උඩ තමයි ඉන්නේ' කියලා. මෙන්න මේ වගේ එකින් එකට හේතු උනත් එකින් එකට ඒ ධර්ම ලක්ෂණ වශයෙන් වෙනස් උනත් උත්සාහයක් නැති ගතියක් තමයි මේ ධර්ම වල තිබෙන්නේ. මේවා සම්පුර්ණයෙන්ම හුදකලා වෙච්ච තනි ධර්ම. ඒකට කියනවා **අව්‍යාපාර නය ස්වභාවය** කියලා.

දැන් හොඳට හිතලා බලන්න **අවිජ්ජා පච්චයා සඞ්ඛාරා** කියලා කිව්වහම අපිට තේරෙන ප්‍රමාණයක් තිබෙනවා. නමුත් ඒවගේ ඇති ලක්ෂණ අපි තේරුම් ගන්නේ නෑ. මම දැන් කිව්වේ මේක ඇතුලේ තිබෙන ටිකක්, නමුත් අපි තේරුම් ගත්තේ නැති ටිකක්. හොඳට හිතලා බලන්න අවිද්‍යාවේ ලක්‍ෂණයමද තිබෙන්නේ විඤ්ඤාණයට, එහෙම නැත්නම් සංස්කාරයට තිබෙන්නේ විඤ්ඤාණයේ ලක්ෂණයමද කියලා. මම මේ කථාව ඉස්සෙල්ලා දවසකත් කිව්වා.

සෑම ධර්මයකම ඒකට ආවේනික වූ **ලක්ඛණ - රස - පච්චුපට්ඨාන - පදට්ඨාන** නැතහොත් **ලක්ෂණය - කෘත්‍යය ගුණය - හේතුවෙන කාරණය - ආසන්න කාරණය** වශයෙන් හැම ධර්මයකම ලක්ෂණ දකින්න ඕනෑ.

**අවිද්‍යාව** නොවෙයි සංස්කාර - සංස්කාර නොවෙයි විඤ්ඤාණය. **අවිද්‍යාවට** තිබෙන්නේ ආරම්මණ ස්වභාවය වසන ගතිය (cover කරන ගතිය) අවිද්‍යාවට එච්චරමයි තිබෙන්නේ.

නමුත් **සංස්කාර** වල ලක්ෂණය ආරම්මණය වසන එකක් නොවෙයි. **සංස්කාරය** කරන්නේ ආරම්මණයට බද්ධ වෙලා එක්කාසු කරන එක (ආයුහනය). සංස්කාරයේ තිබෙන එකතු කිරීමේ හැකියාව අවිද්‍යාවට නෑ. අවිද්‍යාවේ ගුණය සංස්කාරයට නෑ.

ඊළඟට **විඤ්ඤාණය.** හොඳට හිතලා බලන්න, **විඤ්ඤාණය** කියලා කියන්නේ අරමුණේ හැඩ රුව වසන එකක් නොවෙයි. විඤ්ඤාණය කියලා කියන්නේ එකතු කරන එකකුත් නොවෙයි. විඤ්ඤාණය කියලා කියන්නේ දැන ගන්නා ගතිය. ඒකට තිබෙන්නේ එච්චරයි.

**නාම රූප** වලට තිබෙන ලක්ෂණය ඊටත් වෙනස්. ඒකට අවිද්‍යාවේ ලක්ෂණයත් නෑ, විඤ්ඤාණයේ ලක්ෂණයත් නෑ, සංස්කාර ලක්ෂණයත් නෑ.

**සළායතන** ඊටත් වඩා වෙනස්. මේවගේ හැම ධර්මයකටම විශේෂිත වෙච්චි ආවේනික වෙච්ච ලක්ෂණයක් තිබෙනවා. අපි ඒ ලක්ෂණ හිතලා නෑ. අපි සාමාන්‍යයෙන් හිතන්නේ අවිජ්ජා පච්චයා සඞ්ඛාරා - සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං කියලා විතරයි. තව මේවගේ අවස්ථා ප්‍රභේදත් දැනගත යුතුයි. බොහෝ අයට ධර්මයන්ගේ ස්වකීය ලක්ෂණය තේරෙන්නේ නෑ. නමුත් ස්වකීය ලක්ෂණය තේරුම් ගත්තානම් සාමාන්‍යයෙන් ධර්ම දේශනාවක් අහනකොට හොඳට තේරෙනවා.

දැන් අපි ගත්තු සරල උදාහරණය ගැන නැවත හිතන්න. තේ එක හදන්න දාපු ඒවගේ ලක්ෂණ බලන්න එක සමාන ඒවා තිබෙනවාද කියලා. සීනි වල තිබෙන ලක්ෂණය තේ වල නෑ. තේ වල තිබෙන ලක්ෂණයක් සීනි වල නෑ. තේ වල තිබෙන ලක්ෂණය වතුර වල නෑ. වතුර සීනි සහ තේ කොළ වර්ණ වශයෙනුත් වෙනස්. වතුර සීනි සහ තේ ආපු තැන් වශයෙනුත් වෙනස්. වතුර එක්කෝ ළිඳකින් නැත්නම් මොකක් හරි ජල පහරකින්. ඊළඟට සීනි එන්නේ වෙන පැත්තකින්. තේ කොළ එන්නේ වෙන පැත්තකින්. තේ කොළ හදන factory වල නොවෙයි සීනි හදන්නේ. මේ වගේ හැම එකකටම තනි හුදකලා වෙච්ච ලක්ෂණ තිබෙනවා.

අන්න ඒ වගේ තමයි අවිද්‍යාව - සංස්කාරය - විඤ්ඤාණය - නාම රූප - සළායතන - ස්පර්ශය - වේදනාව යන මේ ඔක්කොම තනි තනි තමන්ටම ආවේනික ලක්ෂණ තිබෙන්නාවූ ධර්ම. ඒක නිසා කවදාකවත් කෙනෙකුට ජිනාලංකාර හාමුදුරුවෝ කෙනෙක් වෙන්න බෑ. මට වෙන කෙනෙක් වෙන්නෙත් බෑ. දැන් අරියධම්ම හාමුදුරුවෝ වැඩ හිටියා. මට කවදා කවත් බෑ අරියධම්ම හාමුදුරුවෝ වෙන්න. ඒ කටහඬ ඒ යන විලාසය වෙනස්. ඒ කිසිම විදියකින් මට ඒ වගේ වෙන්න බෑ. එහෙම වෙන්න බැරි ඒ ලක්ෂණ මට නෑ. මට වෙනත් හාමුදුරුවෝ කෙනෙක් වෙන්නත් බෑ. වෙනත් කෙනෙකුට මම වගේ වෙන්නත් බෑ. ඒවගේ අවිද්‍යාව කවදාකවත්ම විඤ්ඤාණය වගේ වෙන්නේ නෑ. ඒක නිසා මේ 'ධර්ම' ලක්ෂණ වශයෙන් වෙනස් - කාල වශයෙන් වෙනස්. මේවා වැඩ කරන තැන් හැටියටත් වෙනස් වෙනවා.

අපි මේ ධර්ම ගන්නේ එක රංචුවට. මේ ධර්ම අපි ලක්ෂණ වශයෙන් හුදකලා කරන්නේ නැති නිසාවෙන් අපිට ඔක්කොම එක පොදියට පෙන්නේ. ඒක නිසයි අපි ඝන සංඥාවට අහුවෙලා තිබෙන්නේ. ඒක කඩන්න තමයි අපි මෙහෙම දෙකට තුනට හූරලා හූරලා දෙන්නේ. මේක ලොකු project එකක්. මේ විදියට පටිච්චසමුප්පාදය හිතීම මෙනෙහි කිරීම නිවන් වලට කිට්ටු වෙන එකක්.

දැන් අපි **නය ස්වභාව** තුනක් ඉගෙන ගත්තා.

1. **ඒකත්ත නය** (වෙන වෙන ලක්ෂණ තිබුණත් එකම පරම්පරාවකට අයිති බැවින්)
2. **නානත්ත නය** (එක පේළියක තිබුණාට කාල වශයෙන් හේතු වශයෙන් ලක්ෂණ වශයෙන් වෙනස් බැවින්)
3. **අව්‍යාපාර නය** (නිරුත්සාහ භාවයෙන් යුක්ත බැවින්) ඊළඟට තිබෙනවා
4. **ධර්මතා නය** කියලා එකක්.

අපි දැන් කිව්වා අවිද්‍යාවට උත්සාහයක් නෑ සංස්කාර හදන්න කියලා. සංස්කාරයන්ටත් කිසිම උත්සාහයක් නෑ විඤ්ඤාණ හදන්න. විඤ්ඤාණයට උත්සාහයක් නෑ නාම රූප හදන්න. ඒ ධර්ම තනි තනි ලක්ෂණ දරාගෙන ඉන්නා වූ ධර්ම.

එහෙම උනත් අවිද්‍යාව ඇති උනොත් ඒ ළඟින්ම සංස්කාරයන්ට උපදින්න ඉඩ සැලසෙනවා හැරෙන්න වෙන කිසිම ධර්මයක් හට ගන්න ඉඩ සැලසෙන්නේ නෑ. ඒ කියන්නේ අවිද්‍යාව ළඟට උපදින්නේ සංස්කාරයක්මයි. ඵස්ස වේදනා උපාදාන ආදී අනෙකුත් ධර්ම තිබුණත් ඒ වෙන කිසිම ධර්මයකට උපදින්න නොදී අවිද්‍යාව ළඟට උපදින්නේ සංස්කාරයක්මයි. සංස්කාරය ළඟට උපදින්නේ විඤ්ඤාණයක්මයි. විඤ්ඤාණයක් ඇති උනොත් ඊළඟට ඇති වෙන්නේ නාම රූපයක්මයි. නාම රූප ළඟට සළායතන. මෙන්න මේ වගේ අවිද්‍යාව නිසා සංස්කාර හැදෙන්න ඉඩ හරිනවා ඇරෙන්න වෙන එකකට එන්න ඉඩ නොදෙන සහ නොඑන එක්තරා ධර්ම ස්වභාවයක් තිබෙනවා. කිසිම අවස්ථාවකදී විඤ්ඤාණයෙන් පස්සේ නාම රූප හට ගන්නවා හැර වෙන කිසිම ධර්මයක් එතැනට එන්නේ නෑ. ඒක ධර්ම ස්වභාවයක්, ධර්ම ගතියක්. මෙන්න මේ ධර්ම ගතියට කියනවා **ධර්මතා නය** කියලා.

අපි වතුර ටිකක් වතුර පෝච්චියකට දාලා ඇල කරනවා. පෝච්චිය ඇල කරාට පස්සේ අපිට හිතන්න පුළුවන්, උපකල්පනය කරන්න පුළුවන් වතුර ටික එළියට එන්නේ නැතුව පෝච්චිය ඇතුලේ තිබෙනවා කියලා. නැත්නම් හිතන්න පුළුවන් වතුර බාගයක් පමණක් එළියට ඇවිල්ලා ඉතුරු ටික ඇතුලේ තිබෙනවා කියලා. එහෙම නැත්නම් අපිට හිතන්න පුළුවන් වතුර ටික එළියට ඇවිල්ලා උඩ පැත්තට යනවා කියලා. නමුත් ඒ එකක්වත් වෙන්නේ නෑ. අපි වතුර ටිකක් දාල පෝච්චියකට ඇල කරාට පස්සේ වෙන්නේ වතුර ටික පහළට යන එක. අපි අනිත් ඒවා මෙහෙම වෙයි, මෙහෙම වෙයි කියලා හිතුවට ඒ එකක්වත් වෙන්නේ නෑ. නමුත් වතුර පෝච්චිය ඇල කරපු ගමන් වතුර ටික එළියට ඇවිල්ලා පහළට යන එකනම් අනිවාර්යෙන්ම සිද්ධ වෙනවා, අනිත් එකක්වත් සිද්ධ වෙන්නේ නෑ. ඒ වගේ ඒකට අදාළ නියමිත ක්‍රමයම සිද්ධ වෙනවාට කියනවා **ධර්මතා නය** කියලා.

සංස්කාරයන්ගේ තිබෙන ලක්ෂණ තමයි හැම වෙලේම එක්කාසු කරන ගතිය. හූරගන්න ගතිය, කොතැනට හරි ගියොත් යමක් උස්සගෙන යන ගතිය. සංස්කාර වල තිබෙන්නේ කොතැන හරි ආරම්මණයට ගිහිල්ලා වැදුනද මොකක් හරි හූරා ගන්නවා. සමහර මිනිස්සු ඉන්නවා ගෙදරකට ආවොත් මොකක් හරි අරගෙන යනවා. ඒ වගේ තමයි චේතනාව (සංස්කාර) කොහේ හරි ගිහිල්ලා වැදුනද මොකක්හරි එකක් එක්කාසු කරගෙන එනවා. ඒ ගතියට කියනවා ආයූහන ගතිය කියලා. ඒ ගතිය වෙන ඒවාට නෑ.

අපි හැමවෙලේම කථා කළේ මුල ටික. අවිද්‍යාව - සංස්කාර - විඤ්ඤාණ - නාම රූප යන ටික තමයි අපි කථා කළේ. තව ඉස්සරහට යනකොට විස්තර නොකරපු, වැඩිය කථා කරන්නේ නැති තැනක් තිබෙනවා. ජාතිය - ජරාමරණ කියන ඒවා බලන්න. **ජාතිය** කියලා කියන්නේ ඉපදීම, හටගැනීම. **ජරාව** කියලා කියන්නේ පරණ වීම, ගෙවී යෑම, දිරා යෑම. එතකොට ඇතිවීමේ ලක්ෂණ නොවෙයි පරණ වීමේ ලක්ෂණය. පරණ වීම සම්පූර්ණයෙන්ම වෙනස් උප්පත්තියට. මරණය කියලා කියන්නේ නැති වෙන එක. මේ 'නැතිවෙන ගතිය' සමාන වෙන්නේ නෑ කිසිසේත්ම 'ඇතිවෙන ගතියට'. ඒ වගේ උප්පතිය සමාන නෑ මරණයට. මරණයට තිබෙන ලක්ෂණය නෑ උප්පතියට, උප්පත්තියට තිබෙන ලක්ෂණය නෑ මරණයට. ඒ මරණයටයි උප්පතියටයි තිබෙන ලක්ෂණ දෙකම නෑ **ජරාවට**. හැම එකක්ම තනි කරන්න කියලා කියන්නේ ඒකයි. මේ ධර්ම හුදකලා කරාට පස්සේ අදාළ ධර්ම ලක්ෂණය මතුවෙනවා.

ඊළඟට **භව**. **භව** කියන එක උප්පතිය නොවෙයි. භව කියලා කියන එක ඇත්ත වශයෙන්ම කර්ම. **භව පච්චයා ජාති** කියන තැන **භව** කියලා කියන්නේ සංස්කාර වලටම තමයි. එතැන වෙන නමකින් තමයි කියන්නේ. ඒවගේ උප්පත්තිය කියන එක ඇතිවීමට හේතුවක් හැටියට තමයි භවය තිබෙන්නේ. ඒ ධර්මතා දෙක වෙනස්. උපාදානය ඊටත් වඩා වෙනස්. හැම එකකටම තිබෙනවා වෙනස් වූ විශේෂිත ලක්ෂණයක්. ඒ ලක්ෂණය විතරයි ක්‍රියාත්මක වෙන්නේ. ඒකට කියනවා **ධර්මතා නය ස්වභාවය** කියලා.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස දානයක් දෙනකොට අතහැරීමෙන් දෙනවා කියලා කියන්නේ මොකක්ද?

<u>පිළිතුර</u> - ඒක විදි දෙකකට කරන්න පුළුවන්. එකක් තමයි ‘මම දෙන ද්‍රව්‍යාත්මක පරිෂ්කාර වලට කිසිම ඇලීමක් බැඳීමක් නැතුව දෙනවා’ කියන එක. ඒක තමයි අතහැරීම කියලා කියන්නේ. ඒ ද්‍රව්‍ය ගැන කිසිම බලාපොරොත්තුවක් මොකක්වත් නැතුවම දෙනවා.

අනිත් කාරණය තමයි ‘මේ දානය නිසා මම ස්වාමීන්වහන්සේලාට කියලා කිසිම වැඩක් කරවා ගන්නේ නෑ, කිසිම උදව්වක් උපකාරයක් මම ගන්නේ නෑ’ කියන එක. හාමුදුරුවරුන්ගෙන් කොහොමත් උදව් ගන්නේ නැති නිසා අපි හිතමු සමාන්‍ය මනුස්සයෙකුට කෑම වේලක් දෙනකොටත් කිසිම බලාපොරොත්තුවක් නැතුව දෙන්න ඕනෑ. මේ මනුස්සයගෙන් මේ කෑම ටිකට වැඩක් ගන්න ඕනෑ කියලා කිසිම බලාපොරොත්තුවක් නැතුව ඒකත් අතහරින්න ඕනෑ.

අනිත් එක තමයි පින. පින අතහරින්න බෑ. ‘මට විපාකය එපා’ කිව්වට වැඩක් වෙන්නේ නෑ. ඒක ධර්ම වලට අයිති එකක්. මට ඕනෑ විදියට නොවෙයි ධර්ම වැඩ කරන්නේ. ඒ ධර්ම වලට, සංස්කාර වලට අයිති කෘත්‍යය කොටසක් තිබෙනවා. අපි ඒවා බාරගත්තත් නැතත් ඒවා ක්‍රියාත්මක වෙනවා. කර්මයක් සිද්ධ කළහම ඒකෙ විපාකය delete කරන්න බෑ. ඒවා අපිට බාරගන්න සිද්ධ වෙනවා. ඒක අත්හැරීම කියන එක නොවෙයි, ඒක ධර්මය තේරුම් ගැනීමක් වෙනවා.

තවත් එක අත්හැරීමක් තිබෙනවා. ඒ තමයි ලෝභ සිත, තණ්හාව අතහැරලා දානය දීම. දානය දීමේදී

- වස්තුව වශයෙන් අතහරිනවා
- ක්ලේශය වශයෙන් අතහරිනවා
- ඊළඟට මම කිසිම දෙයක් ඒ කෙනාගෙන් බලාපොරොත්තු වෙන්නේ නෑ කියලා ඒකත් අතහරිනවා. මේ තමයි අතහැරලා දානය දෙන හොඳම විදිය.

දානයක් පූජා කළහම ඒකෙ තිබෙනවා ඕපධික ශක්තිය. නිරුපධික ශක්තිය කියලත් තිබෙනවා ඕපධික නොවෙන. මේක තවත් විදියකින් කිව්වොත් එහෙම මම කැමතියි පිට්ටනිය වටේ දුවන්න. ඒකටත් මට ශක්තියක් අවශ්‍යයයි. මම කැමතියි පිට්ටනිය වටේ දුවන ගමන් කොහේ හරි තැනකින් එළියට පැන ගන්න. ඒකටත් ශක්තියක් අවශ්‍යයයි. එතකොට පිට්ටනිය වටේ දුවන්නත් මට ශක්තියක් අවශ්‍යයයි, පිට්ටනියෙන් එළියට පැන ගන්නත් ශක්තියක් අවශ්‍යයයි. පිට්ටනිය වටේ දුවන්න ශක්තිය ගන්න ගියොත් එහෙම මම පිට්ටනියෙ කොටු වෙනවා. ඒක නිසා මම ශක්තියක් හදනවා පිට්ටනිය වටේ කරකැවෙන්නේ නැතුව අහකට පැන ගන්න. පිට්ටනිය වටේ දුව දුව ඉන්න එකට කියනවා වටේ යන්න හදන කර්ම කියලා **(වට්ටගාමී කර්ම)** පිට්ටනියෙන් එළියට පැන ගන්න හදන කර්ම වලට කියනවා එළියට පැන ගන්න හදන ශක්තිය කියලා. **(විවට්ටගාමී කර්ම)**

සංසාරය වටේට වටේට යන්න කරන පින්කම් වලට කියනවා **ඕපධිකපුඤ්ඤ කර්ම (වට්ටගාමී කර්ම)** කියලා. ‘මේ රවුම් ගහන එක මට අවශ්‍ය නෑ, ඒක නිසා මගේ මේ කුසල කර්මය සසර ගමන

නවතින්න හේතුවේවා' කියලා මම අධිෂ්ඨාන කරනවා ප්‍රාර්ථනා කරනවා. එහෙම ප්‍රාර්ථනා කරන එකට කියනවා **විවට්ටගාමී කර්ම** කියලා.

මේ දැන් කථා කරන පටිච්චසමුප්පාදය ආදී ධර්ම ඔක්කෝම විවට්ටගාමී. ඔය දිව්‍යලෝක වලට යන අයට මේවා වැඩක් නෑ. මේ ගැඹුරු ධර්ම කථනයන් ඇත්ත වශයෙන් හේතු වෙන්නේම විවට්ටගාමී පැත්තට. ඒකට හේතුව, මේ ධර්ම සාමූහික හැඟීම් කඩන ධර්ම. මේ ධර්ම වලින් කරන්නේ ඝන සංඥාව බිඳින එක.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස දාන පාරමිතාවක් වේවා කියලා අදිෂ්ඨාන කරන්න හොඳ නැත්ද?

<u>පිළිතුර</u> - දැන් මම කිව්වා වටේට යන්න උදව් වෙන කර්ම පාරමී වෙන්නේ නෑ. පාරමී වෙන්නේ නැත්තේ ඒවා වට්ටගාමී නිසා. එළියට පැන ගන්න කරන ක්‍රියා තමයි පාරමී වෙන්නේ.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස ඒක අධිෂ්ඨාන කරන්න ඕනේ නැත්ද?

<u>පිළිතුර</u> - බෝධිසත්වයන් වහන්සේ උනත් නිවන් දකින්න බුදුබව ලබාගන්න අධිෂ්ඨානයක් තිබුණා. බෝධිසත්වයන් වහන්සේ දානේ දුන්නා, බලාපොරොත්තුවක් තිබුණා, target එකක් තිබුණා, යන්න තැනක් තිබුණා. කරන්න ඕනෑ වැඩක් තිබුණා. එහෙම නැතුව 'මම පිංකම් කරනවා යන අහක් ගියදෙන්' කියලා එහෙම කරන්නේ නෑ. කුසල කර්ම වලට අවශ්‍ය නෑ අපිව ගිහිල්ලා වෙන කොහේ හරි බස්සන්න. අපි දාන order එකට අනුව තමයි ඒක වෙන්නේ. හැම වෙලාවේම පිංකමක් කරහම 'සසර දුකින් මිදී යන්න මේ පින මට හේතු වේවා' කියලා ප්‍රාර්ථනා කරන්න ඕනෑ. ඒක තමයි විවට්ටගාමී කර්ම කරනවා කියලා කියන්නේ.

<u>ප්‍රශ්නය</u> - එතකොට ඒක ලෝභය නොවෙයි?

<u>පිළිතුර</u> - නෑ, මේකයි මගේ අර්ථ කථනය. ලෝභය හොඳම නෑ. ලෝභය නරකයි. ලෝභය අකුසල්. ඒක නිසා මේ අකුසල් වෙච්ච ලෝභයෙන් අකුසල් කර කර අපායේ යනවට වඩා හොඳයි ඩිංගක් ලෝභ කරලා නිවන් යනඑක. ලෝභකම් කරලා හරි නිවන් දැක්කට පස්සේ ප්‍රශ්නයක් ඇත්තෙම නෑ. එතකොට නිවන් දැකලා නිසා. නමුත් එතැන තිබෙන්නේ ලෝභය නොවෙයි **ඡන්දය.**

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස එතකොට ප්‍රාර්ථනා නොකළත් කුසලයේ විපාක ලැබෙනවාද?

<u>පිළිතුර</u> - ලැබෙනවා. හේතුව, කුසල කර්ම වල බලයක් තිබෙනවා. කිසිම කෙනෙක් මම මේ කරපු අකුසල කර්මය නිසා මහා විසාල දුකක් පීඩාවක් ඇති වේවා කියලා ප්‍රාර්ථනා කරන්නේ නෑ. ඒක කර්මයේ හැටියට විපාක දෙනවා ඇරෙන්න කිසිම කෙනෙක් ප්‍රාර්ථනා කරන්නේ නෑ, මට දුකක් ගින්දරක් ඇති වේවා කියලා. කුසල කර්මය කරහම අකුසල කර්මයක් එන්නේ නැති වෙන්න block කරන්න පුළුවන් එහෙම හයියක් කුසල කර්මයේ තිබෙනවා. ඒ හයිය නිසාම තමයි සත්වයෝ සසර දුකින් මිදිලා නිවන් දකින්නේ. නැත්නම් අකුසල කර්ම ගොඩක් විපාක දෙන්න හිරවෙලා තිබෙනවා. එවා block කරලා නවත්වන්න පුළුවන් කම තිබෙන්නේම කුසල කර්මයේ හයිය බලය තිබෙන නිසා. ඒක නිසාම තමයි කෙනෙකුට නිවන් දකින්න පුළුවන් කම තිබෙන්නේ.

මිලින්ද රජ්ජුරුවෝ නාගසේන හාමුදුරුවන්ගෙන් අහනවා කුසල්ද බලවත් වෙන්නේ අකුසල් ද බලවත් වෙන්නේ කියලා. අකුසල් බලවත් උනානම් අපිට යන්න බෑ. ඒක නිසා නාගසේන ස්වාමීන් වහන්සේ

දේශනා කරනවා කුසල් බලවත් කියලා. කුසල බලය නිසා තමයි අකුසල් කරපු එක්කෙනා ඉන්න තැනක්වත් හොයා ගන්න බැරි වෙන්න අයින් කරගන්න පුළුවන්කම තිබෙන්නේ.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස පිංකමක් කරලා අවසානයේ අපි දෙවි දේවතාවන්ට පිං අනුමෝදන් කරලා දෙවියන්ගෙන් ආරක්ෂාව ඉල්ලනවා, ඒ ගැන කොහොමද?

<u>පිළිතුර</u> - මෙහෙම එකක් තිබෙනවා. දෙවි දේවතාවන්ගේත් එක්තරා විදියක වර්ග කිරීමක් තිබෙනවා. සමහර ඉන්නවා ඥාති දෙවි දේවතාවෝ. දෙවියන්ට කරන්න පුළුවන් දේවලුත් තිබෙනවා බැරි දේවලුත් තිබෙනවා. ඒක නිසා දෙවියන්ට කළ හැකි යම්කිසි උදව්වක් උපකාරයක් ඇත්නම් කර දෙන්න කියලා තමයි කියන්න තිබෙන්නේ. දෙවියන්ට පිං දීලා සම්පූර්ණයෙන් වැඩ පවරන්නේ නෑ. එහෙම එකක් තමයි අරියධම්ම ස්වාමීන්වහන්සේ කියන්නේ. දෙවියන්ට පිං දුන්නහම හොඳයි. දෙවියන්ට උදව් කරන්න පුළුවන් නම් කරයි.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස සංඝභේදය කරන්න පුළුවන් සංඝයා වහන්සේලාට විතරද?

<u>පිළිතුර</u> - ඔව්, සංඝභේදයයි කේලාම් කීමයි දෙකක්. නියම විදියට සංඝභේදය පඤ්චානන්තරිය කර්මයයි. පඤ්චානන්තරිය කර්මයකට අදාළ වෙන සංඝභේදය සිද්ධ වෙන ක්‍රමයක් තිබෙනවා. මිනිස්සු හරි වෙනත් කෙනෙක් හරි හාමුදුරුවරු පිරිසකට කේලම් කියලා හාමුදුරුවරු කාණ්ඩ වශයෙන් දෙකට කිරීම එකක්. නමුත් සංඝභේදයක් කිරීම සඳහා උපසම්පදා හාමුදුරුවරු අවශ්‍යයි. උපසම්පදා ස්වාමීන්වහන්සේලාගෙන් අවම වශයෙන් හතර දෙනෙක් තමයි සංඝ ගණයට අයිති වෙන්නේ, ඊට වැඩිය කොච්චර හරි කමක් නෑ. එතකොට උපසම්පදා හාමුදුරුවරු 4 නමක් නම් සංඝ - 5 නමක් නම් ඒත් සංඝ - 4 නමකට වැඩි ඔක්කෝම සංඝ ගණයටයි අයිති වෙන්නේ.

අපි හිතමු හාමුදුරුවරු 8 නමක් ඉන්නවා කියලා. ඒ 8 නම දෙකට බෙදෙනවා, හතර හතර. ඒ හතර දෙනාගෙන් එක්කෙනෙක් තමයි ඔය සංඝභේදය කරන්නේ. එතකොට එතැනින් ඒ සංඝභේදය කරන කෙනා අයින් වෙන්න ඕනෑ. එතකොට වෙන්නේ හත් දෙනෙක්. එතකොට ඒ සංඝයාගෙන් තුන්දෙනෙක් කඩලා දානවා. ඒකත් අකුසල තමයි. මේක වෙන්න අවම වශයෙන් ස්වාමීන්වහන්සේලා 9 නමක් අවශ්‍යයයි. ඒ 9 නමෙන් ඒ සංඝභේදය කරන හාමුදුරුවෝ එක පැත්තකට හතර දෙනෙක් වශයෙන් කඩනවා, පොහොය කිරීම වශයෙන්.

හාමුදුරුවරුන්ට අර පන්සලට යන්න එපා, දානයට යන්න එපා කියලා හාමුදුරුවරු යනඑක block කරන එක වෙන කථාවක්. ඒකත් හාමුදුරුවරු බෙදීමක් තමයි නමුත් ඒක සංඝභේදයට යන එකක් නොවෙයි. සංඝභේද කර්මය වෙන්නේ සාමූහිකව උපසම්පදා විනය කර්ම කරමින් එක පිරිසේ එක group එකේ එක නිකායේ ඉන්න හාමුදුරුවරු දෙකට කැඩීමේදී. ඒ දෙකට කඩන එක්කෙනා අයින් වෙනකොට දෙපැත්තට යන අවමයෙන් 8 නමක් ඉන්න ඕනෑ. ඒ කර්මය කරන ස්වාමීන්වහන්සේ සමහ ඔක්කොම 9 නමයි. 'අද ඉඳලා අපි ඔබවහන්සේලා සමග පොහොය කරන්නේ නෑ' කියන කරුණු කාරණා ඉදිරිපත් කරන්නත් ඕනෑ. ඒක පොහොය සීමාවක සිද්ධ වෙන්නත් ඕනෑ. ඊට අමතරව 'සඞ්ඝභෙද' කියලා සූත්‍රයකුත් තිබෙනවා. ඒකෙ වෙන ක්‍රමයකටයි කියන්නේ. හාමුදුරුවරු බෙදීම මිනිස්සු බෙදීම තිබෙනවා. නමුත් සංඝභේදය පඤ්චානන්තරිය කර්මයක් වෙන්නේ මේ විදියටයි.

සංඝභේදය කළේ දෙව්දත් තෙරුන් වහන්සේ. හිතලා බලන්න දෙව්දත් තෙරුන් වහන්සේ ඒක කළ විදිය. දෙව්දත් තෙරුන් වහන්සේ කළේ, හොඳට එකට ස්වාමීන්වහන්සේලා කඩාගෙන 'අපි මීට පස්සේ එකට පොහොය කරන්නේ නෑ' කියලා ඒ හිටපු විහාරයෙන් හාමුදුරුවරු අරගෙන ගියා. එතකොට තමයි ඒ කර්මය සිද්ධ උනේ.

මෙහෙම එකකුත් කරනවා. අපි හිතමු උපසම්පදා ස්වාමීන්වහන්සේලා 500 ක් ඉන්නවා කියලා. ඒ 500 නමක් ඉන්න තැන ස්වාමීන්වහන්සේලා 50 දෙනෙකුට විතර තේරෙනවා අපේ මේ සංඝ සමාජයේ නියම විදියට ධර්මානුකූලව විනයානුකූලව කටයුතු කෙරෙන්නේ නෑ කියලා. මේ 50 දෙනා වහන්සේලා අප්‍රිය කරනවා අනිත් 450 දෙනාගේ හැසිරීම් රටාව, විනයට ගැලපෙන්නේ නැති වැඩ, ධර්මයට ගැලපෙන්නේ නැති වැඩ. ඒක නිසා මේ 50 දෙනා අනිත් අයට බණින්නෙත් නැතුව තම තමන් වෙනම ගිහිල්ලා විනයට ගරු තැන දීලා ධර්මයට ගරු තැන දීලා සාසනානුලෝමිකව වැඩ කටයුතු පෞද්ගලිකව කරගෙන යනවා. අර අය ඇවිල්ලා ඇහුවොත් එහෙම කියන්නේ 'ඔබ වහන්සේලා කරන වැඩ ගැලපෙන්නේ නෑ, අපේ හිතට සැකයක් සංකාවක් එන නිසා මේ විදියට කටයුතු කරනවා' කියලා. ඒක සංඝභේදයක් වෙන්නේ නෑ. හේතුව, ඒක විනයට ධර්මයට ගරුත්වය දීලා කරන කටයුත්තක් නිසා. ඒවගේම ඒක සීමාවක සිදුවෙන දෙයකුත් නොවෙයි. නිකාය හැදෙන්නේ ඔන්න ඔය විදියටයි. ඊට පස්සේ ඒ 50 දෙනා වහන්සේට තව අලුතෙන් පිරිස එකතු වෙනවා. එහෙම වෙලා ඒ පිරිස ලොකු ප්‍රමාණයක් වෙලා ඒක වෙනමම නිකායක් බවට පත්වෙනවා. නමුත් මේ බෙදීම සංඝභේදය **නොවෙයි.**

අනුරාධපුර යුගයේ විශේෂයෙන්ම නිකායවල් 5 ක් තිබුණා. මහා බෝධියත් රුවන්වැලිසැයත් තිබෙන පැත්තේ තිබුණා මහා විහාර පාර්ශවය කියලා නිකායක්. අභයගිරියේ තිබුණා ධර්මරුචික කියලා නිකායක්. ජේතවනරාමය තිබෙන ස්ථානයේ තිබුණා සාගලික කියලා නිකායක්. ඒ අතර තුර ඒ කාලේ තව හිටියා වෛතුල්‍යවාදීන් කියලා කොටසක්. අද කාලේ වගේම ඒ කාලෙත් හිටියා සද්ධර්ම ප්‍රතිරූපකයෝ ටිකක්. ඒ කියන්නේ ධර්මය වගේ පෙනෙන නමුත් ධර්මය නොවෙන වෙනත් දෙයක් බෙදා දෙන කොටසක් හිටියා. ඒ ගොල්ලන්ට කියනවා වාජිරිකයෝ කියලා. මේ නිකායවල් ගොඩක් බෙදුනේ ධර්මයෙන්. ථෙරවාදී සම්ප්‍රදාය ආරක්ෂා කළේ මහා විහාරයේ භික්ෂුන්වහන්සේලා පමණයි. දැනට බුරුමය කාම්බෝජය සියමය යන හැම රටකම තිබෙන්නේ මහා විහාරයේ රැකපු ධර්මය.

<u>ප්‍රශ්නය</u> - එතකොට ස්වාමීන්වහන්ස අභයගිරියේ වැඩ හිටපු ස්වාමීන්වහන්සේලා එක්කෙනෙක් වත් රහතන්වහන්සේලා වෙන්න බැනේ නේද?

<u>පිළිතුර</u> - බෑ, ඒ අය බෝධිසත්වවරු. බුදුබව ප්‍රාර්ථනා කරන අය. මෙහෙමයි, ඔය මහා විහාරයේ වැඩ හිටපු ථෙරවාදී ස්වාමීන්වහන්සේලාත් බුදුබව ප්‍රාර්ථනා කරලා තිබෙනවා. දැන් බුද්ධඝෝෂ ස්වාමීන්වහන්සේත් මහා විහාරයේ භික්ෂුන් වහන්සේ නමක් හැටියට බුදුබව ප්‍රාර්ථනා කරපු හාමුදුරුවෝ කෙනෙක්. ඒ උනාට ඒ ස්වාමීන්වහන්සේලා දෘෂ්ඨිගත වෙන්නේ නෑ. දෘෂ්ඨිගත වෙන්නේ නෑ කියලා කියන්නේ අභයගිරිකයන්ගේ සහ මාහයානිකයන්ගේ තිබෙන අදහස තමයි බුදුවෙලාම තමයි නිවන් දකින්නේ කියන එක. බෝධිසත්ව පාරමී පුරන්න පුළුවන් කියන කථනය තමයි මහායානිකයන්ගේ තිබෙන්නේ.

ථෙරවාදී භික්ෂුන් වහන්සේලාගේ තිබෙන්නේ සෝවාන් - සකෘදාගාමී - අනාගාමී - අරහත් මාර්ග ඵල ලබාගෙන නිවන් දකින්න පුළුවන් කියන එක. ඒ අයට බුදුවෙලා නිවන් දකින්නත් පුළුවන් - පසේ බුදු වෙලා නිවන් දකින්නත් පුළුවන් - මහරහත් භාවයට පත්වෙලා නිවන් දකින්නත් පුළුවන්.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස දෙවෙනි සංගායනාවේදී අභිධර්ම පිටකට සජ්ඣායනා කළාද?

<u>පිළිතුර</u> - දෙවෙනි සංගායනාවේදී අභිධර්ම පිටකට තිබිලා තිබෙන්නේ ධර්ම කොටසටම එකතු කරලා. ඒක වෙන්කළේ ඊට පස්සේ. විශේෂයෙන්ම දෙවෙනි සංගායනාවේදී focus කළේ දස අකැප වස්තුව.

ඊට පස්සේ තමයි ධම්මසංගණිය - විභංගය කියලා ධර්ම කාණ්ඩ විස්තර වෙන් කරලා බෙදලා ඒවා ආරක්ෂා කරන්න කියලා ගෝල බාලයන්ට බාර දුන්නේ.

හොඳයි, සැම දෙනාටම තෙරුවන් සරණයි! ධර්ම අවබෝධය වේවා! නිර්වාණ අවබෝධය වේවා! කියලා ප්‍රාර්ථනා කරනවා.

සාධූ! සාධූ! සාධූ!



ඉහත සඳහන් ධර්ම දේශනාව
අති පූජ්‍ය හන්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි.